# පටුන


- රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගේ පණිවිඩය 01
- දෙපාර්තමේන්තුවේ ව්‍යුහය 03
- අපගේ දැක්ම සහ මෙහෙවර 04

**I වන පරිච්ඡේදය**

දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා ක්‍රියාකාරකම් 05

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය 08

**II වන පරිච්ඡේදය - ලේඛණ ලියාපදිංචි කිරීම.**

1. නොතාරිස්වරුන් පිළිබඳ විස්තර 10
2. 2013 වර්ෂය තුළ නිකුත් කළ නොතාරිස් බලපත්‍ර සංඛ්‍යාව 10
3. ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීමේ දෝෂ නිවැරදි කිරීම 11
4. දිරාපත් ඉඩම් ලේඛන නැවත සකස් කිරීම 11
5. ලේඛන ලියාපදිංචිය 11
6. ලේඛණ සංරක්ෂණය 12
7. ඉල්ලුම් පත්‍ර ලැබීම් 13
8. දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන් 15

**III වන පරිච්ඡේදය - හිමිකම් ලියාපදිංචි කිරීම**

1. හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යාල 17
2. පුහුණු වැඩසටහන් 18
3. මූලා‍ය සහ යටිතල පහසුකම් 18
4. පසු ගනුදෙනු ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය 19
5. දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන් 19

**IV වන පරිච්ඡේදය - සිවිල් ලියාපදිංචි කිරීම**

1. රෙජිස්ට්‍රාර්වරු 21
2. ලියාපදිංචි කරන ලද විවාහ, උපත් සහ මරණ සංඛ්‍යාව 21
3. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලියාපදිංචි කරන ලද විවාහ, උප්පැන්න හා මරණ සංඛ්‍යාව 22
4. සහතික කළ පිටපත් නිකුත් කිරීම 23
5. වි.උ.ම ලේඛණ පරිවර්තන ඉල්ලීම් සංඛ්‍යාව 23
6. අනුමත කරන ලද ප්‍රකාශ පත්‍ර පිළිබඳ තොරතුරු 24
7. නිකුත් කරන ලද අනුමාන වයස් සහතික සංඛ්‍යාව 25
8. කොන්සියුලර් කර්තව්‍ය පනත යටතේ අනුමත කළ ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව 25
9. උධෘත සහ පිටපත් ඉල්ලීම් 25
10. දරුකමට හදාවඩා ගැනීම් සම්බන්ධව තොරතුරු 25
11. මුද්දර ගාස්තු හා වෙනත් ගාස්තු 26

**V වන පරිච්ඡේදය - ලියාපදිංචි හා ලේඛන සංරක්ෂණය සඳහා පරිගණක තොරතුරු තාක්ෂණය භාවිතයට හඳුන්වා දීම.** 28

**VI වන පරිච්ඡේදය - දෙපාර්තමේන්තුවෙන් සපයනු ලැබූ විශේෂ සේවාවන්**

1. ජනතා සත්කාරක සේවා 32
2. විශේෂ සේවාවන් 33
3. නව පත් කිරීම් 33
4. දැනුවත් කිරීම් 34
5. කාර්යාල පහසුකම් වැඩිදියුණු කිරීම 35
6. විදේශ පුහුණු 36

**VII වන පරිච්ඡේදය - ඇගයීම්** 37

**ආදායම් ගිණුම් සාරාංශය**

# රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගේ පණිවිඩය . . .



ඉඩම් ලියාපදිංචි කිරීමේ නීතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ පෙරදැරිව 1864 දී පිහිටුවනු ලැබූ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට 1867 වර්ෂය වන විට මහජනතාවගේ සිවිල් අයිතීන් වන විවාහ , උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කටයුතු ද පැවරුණි. වර්තමානය වන විට ලේඛන ලියාපදිංචි කිරීම, සිවිල් අයිතිවාසිකම් ලියාපදිංචි කිරීම මෙන්ම හිමිකම් ලියාපදිංචි කිරීමද ඇතුළුව පුළුල් ක්ෂේත්‍රයක කටයුතු ආවරණය කරමින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය කරා පිය නගන යුගයේ මහජනතාවට වඩාත් ඵලදායී කාර්යක්ෂම සේවයක් ඉටු කිරීමට තව දුරටත් මං පෙත් එළි පෙහෙළි කරමින් සිටී. ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ සහ එම අමාත්‍යාංශයේ මඟ පෙන්වීම හා උපදේශකත්වය මෙහිදී ඉතා වැදගත් කොට සැළකිය යුතු වේ.

දිවයින පුරා විසිරී ඇති ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල 45ක් හරහා මහජනතාවගේ ලේඛන ලියාපදිංචිය සහ හිමිකම් ලියාපදිංචිය සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත. වර්ෂ 1998 අංක 21 දරණ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතට ගැනෙන ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ කටයුතු වලටද දෙපාර්තමේන්තුව මෑත කාලීනව සම්බන්ධව සිටී. වර්ෂ 1992 දී දිවයිනේ පරිපාලනමය කටයුතු විමධ්‍යගත කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ජනතාවට වඩාත් සමීප රාජ්‍ය සේවයක් සැපයීමේ ක්‍රියාවලියට සමගාමීව යමින් දෙපාර්තමේන්තුව යටතේ පැවති සිවිල් ලියාපදිංචි කිරීමේ කටයුතු ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමට විමධ්‍යගත කරන ලදී. ඒ අනුව දිවයින පුරා පිහිටා ඇති 330 ක් පමණ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරිමට අදාළ වන විවිධ කටයුතු ඉටු කරවා ගැනීමට පහසුකම් සලසා ඇත. මේ හා සම්බන්ධ කටයුතු වලදී නවීන තාක්ෂණික මෙවලම් භාවිතයෙන් මහජනයාට කඩිනමින් හා ගුණාත්මක බවින් ඉහළ කාර්යක්ෂම සේවාවක් ලබා දීමට දෙපාර්තමේන්තුව සැදී පැහැදී සිටී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල මට්ටමෙන් සිදු කෙරෙන සියළුම කාර්යයන් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය සඳහා කලාප කාර්යාල 07ක් පිහිටුවා ඇත. එසේම දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරන ලේඛන සංරක්ෂණය කර ගබඩා කර තැබීමේ කටයුතු මධ්‍යම ලේඛනාගාරය විසින් ඉටු කරයි. ඊට අමතර වශයෙන් විදේශයන්හි දී සිදුවන උපත් සහ මරණ දේශීය වශයෙන් ලියාපදිංචි කිරීමේ කටයුතු ද මධ්‍යම ලේඛනාගාරය මඟින් සිදු කෙරේ.

දිවයින පුරා සේවය කරන විවාහ, උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන් සහ නොතාරිස්වරුන් පත්කිරීමේ සිට ඔවුන්ගේ රාජකාරි වලට අදාල සියළුම කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ. තවද සිවිල් හා ඉඩම් නඩු වලට අදාළව වාර්තා සැපයීමෙන් සහ අධිකරණ නියෝග ක්‍රියාවේ යෙදවීමට දායක වීමෙන් රටේ අධිකරණ කටයුතු වලට ද සක්‍රීය දායකත්වයක් සපයයි. පසුගිය කාල වකවානුව තුළ රටේ පැවති අයහපත් වාතාවරණය යටතේ වුවද ලියාපදිංචි කිරීමේ කටයුතු ප්‍රමුඛත්වයෙහි ලා නොකඩවා සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස , තිස් වසරක් පුරා පැවති යුද්ධය අවසන් වීමෙන් පසු වුවද, සිවිල් ජන ජීවිතයේ නෛතික ආරක්ෂාව ලබා ගැනීමට අවශ්‍ය වන නීත්‍යානුකූල ලිපි ලේඛන වල අවශ්‍යතාවයන් නොපමාව ඉටු කිරීමට අපට හැකියාව ලැබිණි.

නවීන තාක්ෂණයේ ආධාරයෙන් විශ්ව ගම්මානය කරා ශ්‍රී ලංකාව යන ගමනේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකි සේවාවන් පිළිබඳව දේශීය ප්‍රජාව මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාව ද දැනුවත් කිරීම සඳහා වෙබ් අඩවිය මඟින් පහසුකම් සලසා ඇත. තවද වර්තමාන ලෝකය හා අනුගාමීව යන විද්‍යුත් තාක්ෂණික රාජ්‍ය සේවාවක් ඇති කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ "ඉ- ජනගහන රෙජිස්ටරය" වැඩසටහන ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර ඇත.

මෙම සෑම සියළු කර්තව්‍යක් හරහාම වඩාත් මහජන හිතකාමී , කාර්යක්ෂම හා ගුණාත්මක බවෙන් පිරිපුන් රාජ්‍ය සේවයක් සැලසීම දෙපාර්තමේන්තුවේ අභිප්‍රායයි. මෙමඟින් රටේ සමස්ථ සංවර්ධනයටද සාධනීය සහභාගිත්වයක් දැරීමට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට හැකි බව මාගේ විශ්වාසයයි.

ඊ.එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

# දෙපාර්තමේන්තුවේ ව්‍යුහය



## අපගේ දැක්ම...

ලියාපදිංචිය තුළින් අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට ජනතාවට සහාය වීම.

## අපගේ මෙහෙවර ...

ශ්‍රී ලංකාවේ

නිශ්චල හා චංචල දේපළ වලට
අදාල නීත්‍යානුකූල ලේඛන හා
හිමිකම් ලියාපදිංචි කිරීම සහ

ජන ජීවිතයේ මූලික ගෘහස්ථ
සිදුවීම් වන

විවාහ, උපත් සහ මරණ

ලියාපදිංචි කිරීමෙන්ද,

එම ලේඛන සංරක්ෂණය කිරීම
සහ එම ලේඛන වලින් සහතික
පිටපත් නිකුත් කිරීමෙන්ද,

අයිතීන් රැක ගැනීම පිණිස
ජනතාවට සහාය වීම.

# I පරිච්ඡේදය

**<u>කාර්යයන්</u>**

ප්‍රධාන කාර්යයන් තුනකි.

1) ලියාපදිංචි කිරීම.
2) භාරකාරත්වය සහ ලේඛන සංරක්ෂණය.
3) සහතික පිටපත් නිකුත් කිරීම.

**<u>ක්‍රියාකාරකම්</u>**

1. **ලියාපදිංචි කිරීම**

1. 1 **ලේඛණ ලියාපදිංචි කිරීම**

1. නිශ්චල (ඉඩම්) දේපළ වලට අදාළ ලේඛණ ලියාපදිංචි කිරීම
2. චංචල දේපළ වලට අදාළ ලේඛණ ලියාපදිංචි කිරීම
3. ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම

1.2 **හිමිකම් ලියාපදිංචි කිරීම**

1. නිශ්චල දේපළ වලට අදාළ හිමිකම් ලියාපදිංචි කිරීම

1.3 **සිවිල් ලියාපදිංචි කිරීම**

1. ශ්‍රී ලංකාව තුළ සිදුවන සියලුම විවාහ, උපත් හා මරණ ද, විදේශයන්හි දී සිදුවන ශ්‍රී ලාංකිකයන්ගේ විවාහ, උපත් සහ මරණ ද ලියාපදිංචි කිරීම.
2. ළමයින් දරු කමට හදා ගැනීමේ අධිකරණ නියෝග ලියාපදිංචි කිරීම සහ එම ළමයින්ගේ උපත නැවත ලියාපදිංචි කිරීම.
3. උඩරට විවාහ, හා දික්කසාද ඉල්ලීම් මත තීරණ ගැනීම.
4. උඩරට විවාහ දික්කසාද ලියාපදිංචි කිරීම.

**2. භාරකාරත්වය හා සංරක්ෂණය**

ඉහත ලේඛණ, නොතාරිස් දෙවන පිටපත් හා සංරක්ෂණය කළ යුතු අනෙකුත් ලියවිලි හා ලේඛණ වල භාරකාරත්වය සහ සංරක්ෂණය කිරීම.

**3. සහතික පිටපත් නිකුත් කිරීම**

සහතික පිටපත් නිකුත් කිරීමට නියමිත සියළු ලේඛණ වල සහතික කළ පිටපත් එසේ ලබා ගැනීමට බලය ලත් පුද්ගලයින්ට නිකුත් කිරීම.

**<u>අනුෂාංගික ක්‍රියාකාරකම්</u>**

1. විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් පත් කිරීම හා පාලනය.
2. නොතාරිස්වරුන් පත් කිරීම හා පාලනය.
3. ඔප්පු මත හා වෙනත් ලියවිලි මත නියමිත මුද්දර ගාස්තු ගෙවන බවට සහතික වීම.
4. සහතික පිටපත්වල පරිවර්තන නිකුත් කිරීම.
5. සංශෝධන කිරීම.
6. ජීව සංඛ්‍යාති වාර්තා ප්‍රකාශයට පත් කිරීම.
7. නිවාඩු ආඥා පනත ක්‍රියාත්මක කිරීම.

## පනත් සහ ආඥා පනත්

- **ඉඩම් ලියාපදිංචි කිරීම**

1. ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥා පනත
2. සන්නස් සහ පැරණි ඔප්පු ආඥා පනත
3. පැරණි ඔප්පු හා ලියවිලි ලියාපදිංචි කිරීමේ ආඥා පනත
4. ඉඩම් ලේඛණ (පත්ඉරු නැවත සකස් කිරීමේ) ආඥා පනත
5. නොතාරිස් ආඥා පනත
6. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත
7. ඇටෝර්නි බලපත්‍ර ආඥා පනත
8. බද්ධ නිවාස අයිතිවාසිකම් පනත
9. මුද්දර ගාස්තු පනත
10. මුදල් පනත

- **විවාහ,උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම**

1. උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත
2. මරණ ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
3. විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥා පනත
4. උඩරට විවාහ දික්කසාද පනත
5. උඩරට අනුප්‍රප්තික ආඥා පනත
6. මුස්ලිම් විවාහ හා දික්කසාද පනත
7. ළමයින් දරුකමට හදා ගැනීමේ පනත

# දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය

## 2013.12.31 දිනට

| සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| රෙජිස්ට්‍රාර් ජනරාල් | 01 | 01 |
| අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන) | 01 | - |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (ශ්‍රී.ල.ප.සේ.) | 01 | - |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් | 02 | - |
| නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්<br>සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්<br>සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (ශ්‍රී.ල.ප.සේ.) | 02<br>31<br>01 | -<br>06<br>- |
| ගණකාධිකාරී I<br>ගණකාධිකාරී I I I<br>ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) | 01<br>02<br>01 | 01<br>02<br>- |
| සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 01 | - |
| නීති නිලධාරී | 01 | - |
| ඉඩම් රෙජිස්ට්‍රාර්/හිමිකම් රෙජිස්ට්‍රාර් | 43 | 58 |
| පරිපාලන නිලධාරී | 01 | - |
| භාෂා පරිවර්තක | 01 | - |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 02 | - |
| අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්/ අතිරේක හිමිකම් රෙජිස්ට්‍රාර් | 533 | 497 |
| සංවර්ධන නිලධාරී | 400 | 308 |
| අයවැය සහකාර | 01 | - |
| කාර්මික නිලධාරී | 01 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 926 | 552 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 12 | 11 |
| ලේඛණ සහකාර | 209 | 205 |
| පොත් බැදුම්කරු | 76 | 40 |
| රියදුරු | 18 | 16 |
| කාර්යාල කාර්ය සහායක | 363 | 335 |

## ලේඛන ලියාපදිංචි කිරීමෙන් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහාය වෙමු.



# II වන පරිච්ඡේදය

## ලේඛණ ලියාපදිංචි කිරීම

### 01. නොතාරිස්වරුන් පිළිබඳ විස්තර

2013 වර්ෂය තුළ කටයුතු කළ නොතාරිස් වෘත්තියේ යෙදුනු නීතිඥ සහ නීතිඥ නොවන නොතාරිස්වරුන්ගේ ගණන සහ ඔවුන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | නීතිඥ නොතාරිස්වරු | නීතිඥ නොවන නොතාරිස්වරු | මුළු ගණන |
|---|---|---|---|---|
| 1. | 2013 වර්ෂය තුළ අළුතින් වෘත්තීය ආරම්භ කළ ගණන | 503 | 3 | 506 |
| 2. | වසර තුළ ඉල්ලා අස් වූ ගණන | 36 | 1 | 37 |
| 3. | වසර තුළ කටයුතු අත්හිටවූ ගණන | 41 | 4 | 45 |
| 4. | වසර තුළ මිය ගිය ගණන | 23 | 10 | 33 |
| 5. | 2013.12.31 දිනට වෘත්තියේ යෙදී සිටි ගණන | 9,988 | 364 | 10,352 |

### 02. 2013 වර්ෂය තුළ නිකුත් කළ නොතාරිස් බලපත්‍ර සංඛ්‍යාව

1. අලුතින්ම නිකුත් කළ නොතාරිස් බලපත්‍ර සංඛ්‍යාව - 579
2. අතිරේක භාෂාවෙන් කටයුතු කිරීම සඳහා - 370
3. අධිකරණ කලාපය වෙනස් කර ගැනීම සඳහා - 167

## 03. ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීමේ දෝෂ නිවැරදි කිරීම.

1. 2013 වර්ෂය සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව - 2,187
2. 2013 වර්ෂය සඳහා වැඩ අවසන් කළ සංඛ්‍යාව - 2,187

## 04. දිරාපත් ඉඩම් ලේඛණ නැවත සකස් කිරීම

1. ලද ඉල්ලීම් සංඛ්‍යාව - 44
2. අනුමත කරන ලද සංඛ්‍යාව - 22

## 05. ලියාපදිංචිය

1. 2013 වර්ෂය තුළ ලියාපදිංචියට ලද ඔප්පු සංඛ්‍යාව - 951,746
2. 2013 වර්ෂය තුළ ලියාපදිංචියට ලද ඇටෝර්නි බලපත්‍ර සංඛ්‍යාව - 43,941
3. 2013 වර්ෂය තුළ ලියාපදිංචියට ලද හිමිකම් උපලේඛණ සංඛ්‍යාව - 65,427









## 06. ලේඛණ සංරක්ෂණය

වර්ෂය තුළ ලද ඔප්පු දෙවන පිටපත් සංඛ්‍යාව - 1,364,461




2013 වර්ෂයේදී සංරක්ෂණය සඳහා ලද ඔප්පු දෙවන පිටපත් සංඛ්‍යාව 2012 වර්ෂයට වඩා 97.64% කින් වැඩි වී ඇත.

## 07. (අ) සහතික පිටපත් ලබා ගැනීමට ලද ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව

| | | |
|---|---|---|
| 1. ඉඩම් ලේඛණ උධෘත | - | 668,269 |
| 2. ඔප්පු පිටපත් | - | 158,571 |
| 3. ඇටෝර්නි බලපත්‍ර | - | 1,335 |
| 4. හිමිකම් සහතික | - | 37,110 |




2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂය වන විට ඉඩම් ලේඛණ උධෘත සහතික පිටපත් ලබා ගැනීම සදහා සහ ඔප්පු පිටපත් සහතික පිටපත් ලබා ගැනීම සදහා ලද ඉල්ලීම් සංඛ්‍යා පිළිවෙලින් 4.32 %කින් සහ 23.59 %කින් අඩු වී ඇත.

## (ආ) ලේඛණ සෙවීමට ලද ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව

1. ඉඩම් ලේඛණ - 129,289
2. ඔප්පු හා වෙනත් ලේඛණ - 3,091




2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂය වන විට ඉඩම් ලේඛණ සෙවීමට සහ ඔප්පු හා වෙනත් ලේඛණ සෙවීම සදහා ලද ඉල්ලීම් සංඛ්‍යා පිළිවෙලින් 50.76 % කින් සහ 82.02 % කින් අඩු වී ඇත.

## 08. දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන්

| | කාරණය | ගාස්තු (රු.) |
|---|---|---|
| 1. | ඔප්පු හා වෙනත් ලේඛනවල දෙවන පිටපත්වලට අලවන ලද මුද්දර ගාස්තු | 15,498,837,248 |
| 2. | පුරවැසියන් නොවන පුද්ගලයන්ට දේපල පැවරීමේ බදු මුදල් | 78,555,000 |
| 3. | ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥා පනත හා ඇටෝර්නි බලපත්‍ර ආඥා පනත යටතේ අය කළ ගාස්තු | 5,465,492.50 |

බිම් සවිය

ඔබේ ඉඩමේ හිමිකම අපි වඩාත්
තහවුරු කරන්නෙමු ...



# III වන පරිච්ඡේදය

## හිමිකම් ලියාපදිංචි කිරීම

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව ලේඛණ ලියාපදිංචි කිරීමේ ක්‍රමය වෙනුවට හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ආරම්භ කර ඇත. මෙම වැඩසටහන ශ්‍රී ලංකාව තුළ “බිම්සවිය වැඩසටහන” නමින් මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව මේ වන විට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන යටතේ මෙරට ප්‍රමුඛ පෙළේ සංවර්ධන වැඩසටහනක් ලෙස බිම්සවිය වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම වැඩසටහන යටතේ 2013 වර්ෂය තුළ පානදුර ඉඩම් කාර්යාලයේ හිමිකම් ලියාපදිංචි කිරීම ආරම්භ කිරීමට හැකි වූ අතර 2013 වර්ෂය තුළ හිමිකම් ලියාපදිංචි කිරීම ක්‍රියාත්මක වන කාර්යාල සහ ඒ එක් එක් කාර්යාලවලින් ලියාපදිංචි කරන ලද ඉඩම් කැබලි ප්‍රමාණය පහතින් සඳහන් කර ඇත.

| කාර්යාල | වර්ෂයේ ලියාපදිංචි කර ඇති ඉඩම් කැබලි ප්‍රමාණය | 2013 අවසන් වන විට ලියාපදිංචි කර ඇති මුළු ඉඩම් කැබලි ප්‍රමාණය |
|---|---|---|
| අනුරාධපුරය | 595 | 49560 |
| ගම්පහ | 415 | 28165 |
| ගම්පොළ | 3750 | 18434 |
| මීගමුව | 4520 | 36637 |
| රත්නපුර | 6521 | 40391 |
| හෝමාගම | 9699 | 41413 |
| හම්බන්තොට | 3161 | 21378 |
| මහනුවර | 4611 | 17053 |
| දෙල්කඳ | 9842 | 34770 |
| කුරුණෑගල | 2848 | 17694 |
| මොණරාගල | 2786 | 12530 |
| බදුල්ල | 453 | 8721 |
| පොළොන්නරුව | 6060 | 16100 |
| ත්‍රිකුණාමලය | 0 | 861 |
| මාතලේ | 3396 | 4948 |
| කුලියාපිටිය | 2268 | 2870 |
| නුවරඑළිය | 2040 | 2638 |
| පානදුර | 978 | 978 |
| එකතුව | 63,943 | 355,141 |

2013 වර්ෂය තුල ලියාපදිංචිය සඳහා 64,994 ක හිමිකම් උපලේඛණ ප්‍රමාණයක් ලැබී තිබෙන අතර ලියාපදිංචි කල මුළු හිමිකම් උපලේඛණ ප්‍රමාණය 63,943 ක් වේ.

## පුහුණු වැඩ සටහන්

බිම්සවිය වැඩසටහන සම්බන්ධයෙන් ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සහ හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධානයෙන් පවත්වනු ලබන සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහ ගම් මට්ටමින් සංවිධානය කරනු ලබන ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලට ද මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දී ඇත.

## මූල්‍ය සහ යටිතල පහසුකම්

2013 වර්ෂය තුළ අත්තනගල්ල , මාතර කාර්යාලවල යටිතල පහසුකම් වැඩි දියුණු කරන ලද අතර එම කටයුතු සඳහා රු 1355075.5 ක මුදලක් වැය කරන ලදී. එමෙන්ම 2013 වර්ෂය අවසානයේ දී හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු 9,380,621.50 ක් වූ අතර රු 3,752,248.60 ක මුදලක් පසුගනුදෙනු සාධන පත්‍ර ලියාපදිංචි කිරීම තුලින් හිමිකම් රක්ෂණ අරමුදලට බැරකිරීමට හැකිවිය. එසේම 2012 වර්ෂයට වඩා 2013 වර්ෂය තුල රු 1,191,740.60 ක මුදලක් රක්ෂණ අරමුදලට බැර කිරීමට හැකියාව ලැබුණි. 2013 වර්ෂයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායමෙන් රු 3,399,995.61 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමට හැකියාව ලැබුණි.

පසුගිය පස්වසරක කාලය තුළ බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවට ලැබී ඇති ප්‍රතිපාදන සහ වියදම පහත දැක්වේ.



**පසු ගනුදෙනු ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය**

බිම්සවිය වැඩසටහන යටතේ 2012 වර්ෂයේ පසු ගනුදෙනු සාධන පත්‍ර 10,402 ක් ද 2013 වර්ෂයේ පසු ගනුදෙනු සාධන පත්‍ර 13,491 ක්ද ලියාපදිංචි කරන ලදී. මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි කරන ලද පසු ගනුදෙනු සංඛ්‍යාව 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ 30% කින් ද වර්ධනය වී ඇත. මෙම වැඩසටහන යටතේ හිමිකම් කාර්යාල 18 හි ලියාපදිංචි කරන ලද ලියාපදිංචි කරන ලද පසු ගනුදෙනු සංඛ්‍යාව පහත දැක්වේ.




## දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන්

| | කාරණය | ගාස්තු (රු.) |
|---|---|---|
| 1. | හිමිකම් ලේඛණ උධෘත සහ හිමිකම් සහතික පිටපත් නිකුත් කිරීමේ ගාස්තු | 8,498,000.00 |
| 2. | හිමිකම් සාධන පත්‍ර වෙනුවෙන් පළාත් පාලන ආයතන වලට හෝ රජයට අය කරන ලද මුද්දර ගාස්තු | 183,006,862.86 |

**විවාහ, උපත් සහ මරණ ලියාපදිංචි කිරීමෙන් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහාය දෙමු.**



# IV වන පරිච්ඡේදය

## සිවිල් ලියාපදිංචි කිරීම

### 01. රෙජිස්ට්‍රාර්වරු

2013.12.31 දිනට සේවයේ යෙදී සිටි රෙජිස්ට්‍රාර්වරුන්ගේ ගණන 1,569 කි. ඔවුහු පහත සඳහන් වර්ග වලට අයත් වේ.

| | | |
|---|---|---|
| 1. | විවාහ , උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරු | 773 |
| 2. | විවාහ (අතිරේක) රෙජිස්ට්‍රාර්වරු | 347 |
| 3. | උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරු | 62 |
| 4. | උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරු | 50 |
| 5. | මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරු | 337 |
| | **මුළු ගණන** | **1,569** |

### 02. 2013 වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද විවාහ, උපත් සහ මරණ සංඛ්‍යාව

1) විවාහ - 178,031
2) උපත් - 367,656
3) මරණ - 128,552




2013 වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද විවාහ සංඛ්‍යාව 2012 වර්ෂයට සාපේක්ෂව 38 % කින් අඩු වීමක් ද උපත් සහ මරණ සංඛ්‍යා පිළිවෙලින් 44% කින් සහ 36% කින් වැඩි වීමක් ද පෙන්වයි.

**03. 2013 වර්ෂය තුළ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලියාපදිංචි කරන ලද විවාහ , උප්පැන්න හා මරණ සංඛ්‍යාව**

1) විවාහ - 275
2) උපත් - 8,195
3) මරණ - 447




04. විවාහ,උප්පැන්න සහ මරණ සහතික සහ අනුමාන වයස් සහතික පිටපත් ලබා ගැනීම සඳහා ලද ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව - 2,234,950

05. වි.උ.ම ලේඛණ පරිවර්තන ඉල්ලීම්

| ලේඛණය | ඉල්ලුම් පත් සංඛ්‍යාව | නිකුත් කළ පිටපත් සංඛ්‍යාව |
|---|---|---|
| විවාහ,උප්පැන්න සහ මරණ | 33,989 | 41,442 |




2013 වර්ෂයේ විවාහ, උප්පැන්න සහ මරණ සහතික පරිවර්තනය සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව 2012 වර්ෂයට වඩා 27.24% කින් අඩු වී ඇත.

## 06. අනුමත කරන ලද ප්‍රකාශ පත්‍ර පිළිබඳ තොරතුරු

| කාරණය | ලද ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව |
|---|---|
| ලියාපදිංචි නොවූ උපත් ලියාපදිංචි කිරීම. | 31,951 |
| නම් වෙනස් කිරීම් හා සංශෝධන කිරීම. | 46,657 |
| ලියාපදිංචි නොවූ මරණ ලියාපදිංචි කිරීම. | 3,920 |
| ලිපි දෝෂ හා වෙනත් අනුශාංගික තොරතුරු නිවැරදි කිරීම. | 14,895 |

**07. නිකුත් කරන ලද අනුමාන වයස් සහතික සංඛ්‍යාව - 6,991**

**08. 2013 වර්ෂය තුළ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලද ප්‍රකාශ පත්‍ර මත අනුමත කළ ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව**

| වගන්තිය | ලද ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව | අනුමත කළ ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| 24 | 2463 | 2463 |
| 27 | 213 | 213 |
| 27ඒ | 110 | 107 |
| 36 | 443 | 443 |
| 52 | 95 | 95 |

**09. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලද උධෘත සහ පිටපත් පිළිබඳ ඉල්ලීම්**

| වගන්තිය | ලද ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|
| උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනත | 15,633 |
| විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ පනත | 65 |
| උඩරට විවාහ සහ දික්කසාද පනත | 26 |
| මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත | 56 |

**10. දරුකමට හදාවඩා ගැනීම් සම්බන්ධව තොරතුරු**

1) දරුකමට හදා වඩා ගැනීමේ ආඥා පනත යටතේ අධිකරණය මගින් නිකුත් කරන ලද නියෝග සංඛ්‍යාව - 1,350

2) දරුකමට හදාවඩා ගැනීමේ සහතික පිටපත් - 1,419

3) දරුකමට හදාවඩා ගත් ළමයින්ගේ උපත් ලියාපදිංචිය - 1,563




## 11. මුද්දර ගාස්තු හා වෙනත් ගාස්තු

2013 වර්ෂය තුළ විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අය කර ගන්නා ලද මුද්දර ගාස්තු හා වෙනත් ගාස්තු පහත දැක්වේ.

| | කාරණය | රු. |
|---|---|---|
| 1 | උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත, විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ පනත, උඩරට විවාහ සහ දික්කසාද පනත හා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත යටතේ අය කර ගත් ගාස්තු | 388,604.50 |

# තොරතුරු තාක්ෂණ යුගයට ..............



ලියාපදිංචි හා ලේඛන සංරක්ෂණය සඳහා පරිගණක තොරතුරු තාක්ෂණය භාවිතයට හඳුන්වා දීම.

# V වන පරිච්ඡේදය

## තොරතුරු තාක්ෂණයේ ප්‍රගතිය

**උප්පැන්න , මරණ සහ විවාහ සහතික පරිගණක ගත කිරීම.**
**e BMD**

උප්පැන්න මරණ විවාහ සහතික පරිලෝඛනය කර පරිගණක භාවිතයෙන් සහතික පිටපත් නිකුත් කිරිම මේ යටතේ කරනු ලැබේ.



2013 වර්ෂය අවසාන වන විට පහත දැක්වෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් නවීන තාක්ෂණය යොදා උපත්, විවාහ සහ මරණ සහතික පරිගණක මගින් නිකුත් කිරීමට පියවර ගෙන තිබේ.

| ආවරණය කරන ලද දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | පිටපත් නිකුත් කරන කාර්යාල |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| බදුල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | බදුල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| කෑගල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | කෑගල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |

| ආවරණය කරන ලද දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | පිටපත් නිකුත් කරන කාර්යාල |
|---|---|
| මොණරාගල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මොණරාගල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| යාපනය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | යාපනය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| පුත්තලම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | පුත්තලම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| අම්පාර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | අම්පාර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| නුවරඑළිය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| මුලතිව් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මුලතිව් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| ගම්පහ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ගම්පහ, අත්තනගල්ල ,මීරිගම,වත්තල, ජාඇල සහ මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| මහනුවර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ගඟවට කෝරළය සහ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| වවුනියාව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වවුනියාව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| මන්නාරම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මන්නාරම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ත්‍රිකුණාමලය නගරය සහ කඩවත් සතර , කින්නියා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| මඩකලපුව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| මාතර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස, කඹුරුපිටිය,මාතර, වැලිගම, දික්වැල් සහ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල |

| ආවරණය කරන ලද දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | පිටපත් නිකුත් කරන කාර්යාල |
|---|---|
| ගාල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ගාල්ල ,හික්කඩුව , හබරාදුව , බෙන්තොට, බලපිටිය සහ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| කළුතර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | කළුතර, බේරුවල, පානදුර සහ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ දිවයිනේ අනිකුත් දිස්ත්‍රික්කයන්හි සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සහතික පරිගණක ගත කර ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අනිකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සහතික ඉදිරි කාලයේ දී පරිගණක ගත කිරීමට නියමිතය.



## ඉඩම් ලියාපදිංචි කිරීමේ තොරතුරු පරිගණක ගත කිරිම.
## e LR

ඉඩම් ලියාපදිංචි කිරීමේ තොරතුරු පරිගණක ගත කිරිමේ වැඩසටහන යටතේ ආරම්භක පියවර ලෙස ඉඩම් ලේඛන පරිලෝඛනය කර පරිගණක භාවිතයෙන් සහතික පිටපත් නිකුත් කිරිමට කටයුතු කරමින් පවතී. කොළඹ , දෙල්කඳ , ගම්පහ , යාපනය හා මන්නාරම යන ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයන්හි ඇති ඉඩම් ලේඛන මුල් අදියර යටතේ පරිගණක ගත කිරිම 2013 වසරේදී ආරම්භ කරන ලදී.



ඉඩම් ගනුදෙනු වලට අදාල තොරතුරු සටහන් කරනු ලබන්නේ ඉඩම් ලේඛනවලය. ඉඩම් ලේඛනයක ඇත්තේ එක් පිටපතක් පමණි. මෙම පරිගණක ගත කිරිමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන්

- ලේඛන පරීක්ෂා කිරිමේ පහසුව වැඩි වීම.
- ස්වාභාවික හේතු මත ලේඛන දිරාපත් විමෙන් ඇතිවන අපහසුතා මඟ හැරීම.
- තොරතුරු විකෘති කිරීමේ අක්‍රමිකතා වැලැක්වීම යනාදිය ලැබෙන ප්‍රතිලාභ වේ.

# VI වන පරිච්ඡේදය

## දෙපාර්තමේන්තුවෙන් සපයනු ලැබූ විශේෂ සේවාවන්

### 01. ජනතා සත්කාරක සේවා

ජනතාවගේ නිශ්චල හ චංචල දේපල සඳහා ඇති අයිතීන් ද ,සිවිල් අයිතීන් ද සුරැකීම සඳහා කාර්යාලයීය මට්ටමින් ඉටු කරනු ලබන ක්‍රියා දාමයට අමතරව ලියාපදිංචි වී නොමැති හා ලියාපදිංචි නොවූ උපත් ලියාපදිංචි කිරීම සඳහාත්, විවාහ නොවූ පවුල්වල විවාහ ලියාපදිංචි කිරීම සඳහාත් , ජංගම සේවාවන් පවත්වා මහජනතාවට සේවාවන් සපයනු ලැබේ. එකී ජංගම සේවාවන් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දීමට කටයුතු කරනු ලැබේ. 2013 වසර තුළ එවැනි ජංගම සේවා පැවැත්වීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනුග්‍රහය දැක්වූ ආයතනය | ජංගම සේවා ගණන |
|---|---|
| 1. ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 10 |
| 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 06 |
| 3. ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 31 |
| 4. සමාජ සේවා අමාත්‍යාංශය | 2 |
| 5. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 2 |
| 6. මැතිවරණ දෙපාර්තමේන්තුව | 2 |
| 7. මහජන සම්බන්ධතා කටයුතු අමාත්‍යාංශය | 2 |
| 8. CAF සහ සේවක අර්ථසාධක අරමුදල PAFFERAL | 17 |
| 9. සේවක අර්ථසාධක අරමුදල | 1 |
| 10 . කොත්මලේ ප්‍රාදේශීය සභාව | 1 |
| 11. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 4 |

## 02. විශේෂ සේවාවන්

**01.** මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වලට අයත් විවාහ, උපත් සහ මරණ සහතික වල පරිලෝකන දත්ත පද්ධතිය මගින් උප්පැන්න සහතික නිකුත් කිරීම 2013.10.11 දින ඇරඹීම.




## 03. නව පත් කිරීම්

01. නව පත්වීම් ලැබූ රෙජිස්ට්‍රාර් සේවය III පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පත්වීම් ලිපි ප්‍රධානය කිරීම ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ඩබ්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේදී 2013.08.02 දින පැවැත්විය.




# 04. දැනුවත් කිරීම්

01. ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද බිම් සවිය වැඩසටහනේ ඉදිරි සැලසුම් සහ ඉඩම් ලේඛන පරිලෝකනය කර පරිගනකගත කිරීමේ වැඩමුළුව දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ දී 2013.09.05,06 සහ 07 යන දිනයන්හිදී පැවැත්විය.





**02.** 2013.08.02 වෙනි දින පත්වීම් ලැබූ රෙජිස්ට්‍රාර් සේවය III පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ප්‍රධාන කාර්යාලයේ දී පැවැත්වීය.





**03.** යාපනය, කිලිනොච්චිය, මුලතිව්, වව්නියා සහ මන්නාරම දිස්ත්‍රික්ක වල රෙජිස්ට්‍රාර්වරුන්, අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්, රෝහල් කාර්ය මණ්ඩලය සහ සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් යාපනය සහ වව්නියා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලදී 2013 නොවැම්බර් මස 18 සහ 19 යන දෙදින තුළ පැවැත්විය.





## 05. නව කාර්යාල පිහිටුවීම සහ කාර්යාල පහසුකම් වැඩිදියුණු කිරීම

01. රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය, කොළොන්න, ගොඩකවෙල සහ කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ජනතාවගේ ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම අයුරින් සිදු කිරීමේ අරමුණින් ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය 2013. 12.13 දින ඇඹිලිපිටිය නගරයේ විවෘත කරන ලදී.





02. කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය නවීකරණය කිරීම සිදු විය.

 

## 06. විදේශ පුහුණු

01. රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා ඇතුළු මාණ්ඩලික නිලධාරීන් කිහිපදෙනෙකු පිලිපීනයේ ඉඩම් පරිපාලනය සහ කළමණාකරණය සම්බන්ධව 2013.03.10 දින සිට 2013.03.15 දක්වා සිදු කළ අධ්‍යයනය චාරිකාව.

 



# VII වන පරිච්ඡේදය

## ඇගයීම්

- විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය මගින් පවත්වන ලද ඇගයීම් ක්‍රියාවලියේදී, 1919 - රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය හරහා ගෙවුනු වසර පහ තුළ රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමට දායක වූ රාජ්‍ය ආයතන හය අතරට පත් වීමට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට හැකි විය.



# 2013 වසරේ

# ගිණුම් සාරාංශය

ඩී.ජී.එස්.ඒ-ආදායම-1/அ.க.ப.அ.அரசிறை-1/ DGSA-Revenue-1

# 2013 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම් සාරාංශය

## 2013டிசம்பர் 31 இல் முடிடைந்த ஆண்டிற்கான இலங்கை சனநாயக சோசலிக் குடியரசு அரசாங்கத்தின் அரசிறைக் கணக்குகளின் பொழிப்பு

## Summary of the Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka for the year ended 31st December 2013

| ආදායම් ගණන්දීමේ නිලධාරි : රෙජිස්ට්‍රාර් ජනරාල් /பதிவாளர் நாயகம் / Registrar General<br>அரசிறைக் கணக்கீட்டு உத்தியோகத்தர்<br>Revenue Accounting Officer : | | | | වියදම් ශීර්ෂ අංකය : 254<br>செலவினத் தலைப்பு இல<br>Expenditure Head No. | |
|---|---|---|---|---|---|
| ආදායම් සංකේතය/<br>அரசிறைக் குறியீடு/<br>Revenue code | ආදායම් සංකේත විස්තරය/அரசிறைக் குறியீடு விவரணம்/ Description of Revenue Code | 2013 මුලික ආදායම් ඇස්තමේන්තුව மூல அரசிறை மதிப்பீடு 2013 Original Revenue Estimate 2013 | 2013 සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව திருத்திய அரசிறை மதிப்பீடு 2013 Revised Revenue Estimate 2013 | 2013 රැස්කරන ලද මුළු ශු. ආදායම (දළ ආදායම - ආදායම් ආපසු ගෙවීම්)<br>சேகரிக்கப்பட்டமொத்த தேறிய அரசிறை (அரசிறை மீளளிப்புக்களை கழித்து)மொத்த அரசிறை 2013<br>Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2013 | 2012 රැස්කරන ලද මුළු ශු. ආදායම (දළ ආදායම - ආදායම් ආපසු ගෙවීම්)<br>சேகரிக்கப்பட்டமொத்த தேறிய அரசிறை (அரசிறை மீள்ளிப்புக்களை கழித்து)மொத்த அரசிறை 2012<br>Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2012 |
| | | රු./ ரூபா/Rs. | රු./ ரூபா/Rs. | රු./ ரூபா/Rs. | රු./ ரூபா/Rs. |
| 10:03:07:02 | ලියාපදිංචි කිරීමේ ගාස්තු / பதிவுக் கட்டணம் / Registration Fee | *178,000,000 | **1,025,000,000 | 1,135,204,321 | 217,795,350 |
| | **එකතුව/மொத்தம்/ Total** | **178,000,000** | **1,025,000,000** | **1,135,204,321** | **217,795,350** |

* 2013 වර්ෂයේ ඇස්තමේන්තු වල රු. මිලියන 808 වශයෙන් භාණ්ඩාගාරය මගින් ඇතුළත් කර ඇත.

** 2013 වර්ෂයේ ඇස්තමේන්තු වල රු.මිලියන 1225 වශයෙන් භාණ්ඩාගාරය මගින් ඇතුළත් කර ඇත.

මෙම සාරාංශ ප්‍රකාශයෙහි සඳහන් සියළුම සංඛ්‍යා, පවත්වා ගෙන යනු ලබන ගිණුම් පොත්වල සඳහන් සංඛ්‍යා සමග එකඟවන බවත්, ඒවා භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සසඳන ලද බවත් තහවුරු කරමි.

இக்கணக்குகளில் காணப்படும் புள்ளி விவரங்கள் வைத்திருக்கப்படும் கணக்குப் புத்தகங்களிலுள்ள புள்ளி விவரங்களுடன் ஒத்திருக்கின்றன எனவும் இப்புள்ளி விவரங்கள் யாவும் திறைசேரிக் கணக்குப் புத்தகங்களுடன் ஒப்பிடப்பட்டன எனவும் உறுதிப்படுத்துகின்றேன்.

Certify that the figures appear in this Summary Statement are in agreement with the figures in the Books of Account maintained and all these figures have been reconciled with the figures in the Treasury Books of Account.

ඩී.ජී.එස්.ඒ-ආදායම-1/ அ.க.ப.அ.அரசிறை-1/ DGSA-Revenue-1

## 2013 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම් සාරාංශය
**2013டிசம்பர் 31 இல் முடிவடைந்த ஆண்டிற்கான இலங்கை சனநாயக சோசலிக் குடியரசு அரசாங்கத்தின் அரசிறைக் கணக்குகளின் பொழிப்பு**

## Summary of the Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka for the year ended 31st December 2013

| ආදායම් ගණන්දීමේ නිලධාරි : அரசிறைக் கணக்கீட்டு உத்தியோகத்தர் Revenue Accounting Officer : | රෙජිස්ට්‍රාර් ජනරාල් / பதிவாளர் நாயகம் / Registrar General | | වියදම් ශීර්ෂ අංකය : செலவினத் தலைப்பு இல Expenditure Head No. | 254 | |
|---|---|---|---|---|---|
| ආදායම් සංකේතය/அரசிறைக் குறியீடு/ Revenue code | ආදායම් සංකේත විස්තරය/ அரசிறைக் குறியீடு விவரணம்/ Description of Revenue Code | 2013 මූලික ආදායම් ඇස්තමේන්තුව மூல அரசிறை மதிப்பீடு 2013 Original Revenue Estimate 2013 | 2013 සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවதிருத்திய அரசிறை மதிப்பீடு 2013 Revised Revenue Estimate 2013 | 2013 රැස්කරන ලද මුළු ශු. ආදායම (දළ ආදායම - ආදායම් ආපසු ගෙවීම්) சேகரிக்கப்பட்டமொத்த தேறிய அரசிறை (அரசிறை மீளளிப்புக்களை கழித்து)மொத்த அரசிறை 2013 Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2013 | 2012 රැස්කරන ලද මුළු ශු. ආදායම (දළ ආදායම - ආදායම් ආපසු ගෙවීම්) சேகரிக்கப்பட்டமொத்த தேறிய அரசிறை (அரசிறை மீள்ளிப்புக்களை கழித்து)மொத்த அரசிறை 2012 Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2012 |
| | | රු./ ரூபா/Rs. | රු./ ரூபா/Rs. | රු./ ரூபா/Rs. | රු./ ரூபா/Rs. |
| 10:03:02:00 | පැවරුම් බද්ද / கைமாற்றல் வரி / Transfer Tax | **112,000,000.00** | **1,600,000.00** | **78,555,000.00** | **92,306,547.00** |
| | **එකතුව/மொத்தம் / Total** | **112,000,000.00** | **1,600,000.00** | **78,555,000.00** | **92,306,547.00** |

මෙම සාරාංශ ප්‍රකාශයෙහි සඳහන් සියළුම සංඛ්‍යා, පවත්වා ගෙන යනු ලබන ගිණුම් පොත්වල සඳහන් සංඛ්‍යා සමග එකඟවන බවත්, ඒවා භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සසඳන ලද බවත් තහවුරු කරමි.

இக்கணக்குகளில் காணப்படும் புள்ளி விவரங்கள் வைத்திருக்கப்படும் கணக்குப் புத்தகங்களிலுள்ள புள்ளி விவரங்களுடன் ஒத்திருக்கின்றன எனவும் இப்புள்ளி விவரங்கள் யாவும் திறைசேரிக் கணக்குப் புத்தகங்களுடன் ஒப்பிடப்பட்டன எனவும் உறுதிப்படுத்துகின்றேன்.

Certify that the figures appear in this Summary Statement are in agreement with the figures in the Books of Account maintained and all these figures have been reconciled with the figures in the Treasury Books of Account.

ඩී.ජී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2013

**වියදම් ශීර්ෂ අංකය: 254** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරිම | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) | පිටු අංකය (අදාල ඩී.ජී.එස්.ඒ. 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 01 | **පුනාරාවර්තන**<br>මෙහෙයුම් ක්‍රියාකාරකම් | 691,400,000 | 97,249,466 | - | 788,649,466 | 785,469,894 | 3,179,572 | **02** |
| | **උප එකතුව (පුනාරාවර්තන)** | 691,400,000 | 97,249,466 | - | 788,649,466 | 785,469,894 | 3,179,572 | |
| 01 | **මූලධන**<br>මෙහෙයුම් ක්‍රියාකාරකම් | 64,850,000 | - | - | 64,850,000 | 49,663,844 | 15,186,156 | **02** |
| | **උප එකතුව (මූලධන)** | 64,850,000 | | | 64,850,000 | 49,663,844 | 15,186,156 | |
| 01 | පුනාරාවර්තන එකතුව | 691,400,000 | 97,249,466 | - | 788,649,466 | 785,469,894 | 3,179,572 | **02** |
| 01 | මූලධන එකතුව | 64,850,000 | - | - | 64,850,000 | 49,663,844 | 15,186,156 | **02** |
| | **මුළු එකතුව** | **756,250,000** | **97,249,466** | | **853,499,466** | **835,133,738** | **18,365,728** | |

පිටු අංක...01....... සිට ...22...... දක්වා ඩී.ජී.එස්.ඒ. 2 සිට 11 දක්වාවූ ආකෘතිපත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන විස්තරාත්මක වැඩසටහන් විසර්ජන ගිණුම් ප්‍රකාශයන්ද අංක...23....... සිට ...43....... දක්වාවූ අනෙකුත් අදාල සටහන්ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටසක් ලෙස සැකසේ.

මෙම ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, අනිකුත් සවිස්තරාත්මක ප්‍රකාශන හා අනිකුත් සටහන් නිවැරදි බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමග අදාල ගිණුම් සැසඳීම් කරන ලද බවත් ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම-2013

**වියදම් ශීර්ෂ අංකය:254** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.ජී.එස්.ඒ. ආකෘති යොමුව සමග) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1-2)+3+4 | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) අවුරා තබන ලද ප්‍රතිපාදනය සහිතව (1+3+4)-6 | සටහන් අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ. ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ඒ. 3) | 691,400,000 | 97,249,466 | | 788,649,466 | 785,469,894 | 3,179,572 | **03** |
| (ආ) මූලධන (ඩී.ජී.එස්.ඒ. 4) | 64,850,000 | - | | 64,850,000 | 49,663,844 | 15,186,156 | **04 & 05** |
| **එකතුව** | **756,250,000** | **97,249,466** | | **853,499,466** | **835,133,738** | **18,365,728** | |

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

**වියදම් ශීර්ෂ අංකය: 254** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**
**වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| ව්‍යාපෘති අංකය /නම, පෞද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනිකුත් අයකිරීම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම (+/-) | (3) මු.රෙ. 66, 69 අනුව මාරුකිරීම් (+/-) | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1-2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **ව්‍යාපෘති අංකය 01 හා නම:සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සේවා** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 78,250,000 | - | (1,000,000) | 77,250,000 | 77,061,023 | 188,977 |
| අනෙකුත් වියදම් | 40,400,000 | 39,600,000 | (2,600,000) | 77,400,000 | 76,341,128 | 1,058,872 |
| **උප එකතුව** | 118,650,000 | 39,600,000 | (3,600,000) | 154,650,000 | 153,402,151 | 1,247,849 |
| **ව්‍යාපෘති අංකය 02 හා නම: ලියාපදිංචි කිරීමේ කටයුතු** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 423,000,000 | 47,649,466 | 1,700,000 | 468,949,466 | 468,940,607 | 8,859 |
| අනෙකුත් වියදම් | 149,750,000 | 10,000,000 | (5,300,000) | 165,050,000 | 163,127,136 | 1,922,864 |
| **උප එකතුව** | 572,750,000 | 57,649,466 | (3,600,000) | 633,999,466 | 632,067,743 | 1,931,723 |
| **මුළු එකතුව** | **691,400,000** | **97,249,466** | **-** | **788,649,466** | **785,469,894** | **3,179,572** |

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

**වියදම ශීර්ෂ අංකය: 254 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**ව්‍යාපෘති අංකය හා නාමය: 02 ලියාපදිංචි කිරීමේ ගාස්තු**

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යාකාර (මූලාශ්‍ර අංකය) | අයිතම විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් | මූ.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන සහ පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මුළු ශුද්ධ වෙන්කිරීම (1-2+3) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) අවුරා තබන ලද ප්‍රතිපාදනය සහිතව (4-5) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | (1) | (2) | (3) | (4) | (5) |
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම්</u> | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 15,000,000 | 10,000,000 | 25,000,000 | 20,515,290 | 4,484,710 |
| | | | **උප එකතුව** | 15,000,000 | 10,000,000 | 25,000,000 | 20,515,290 | 4,484,710 |
| | | | <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලිය උපකරණ | 10,000,000 | | 10,000,000 | 8,237,690 | 1,762,310 |
| 2103 | | 11 | යන්ත්‍ර, යන්ත්‍රෝපාංග සහ උපකරණ | 10,000,000 | | 10,000,000 | 7,311,140 | 2,688,860 |
| 2104 | | 11 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 7,000,000 | (5,000,000) | 2,000,000 | 568,190 | 1,431,810 |
| | | | **උප එකතුව** | 27,000,000 | (5,000,000) | 22,000,000 | 16,117,020 | 5,882,980 |
| | | | <u>හැකියා වර්ධනය</u> | | | | | |
| 2401 | | 11 | පුහුණු කිරීම් සහ හකියා වර්ධනය | 1,000,000 | | 1,000,000 | 0 | 1,000,000 |
| | | | **උප එකතුව** | 1,000,000 | | 1,000,000 | 0 | 1,000,000 |
| | | | **මුළු එකතුව** | **43,000,000** | **5,000,000** | **48,000,000** | **36,632,310** | **11,367,690** |
| | | | **සමස්ත එකතුව** | **64,850,000** | **-** | **64,850,000** | **49,663,844** | **15,186,156** |

# වියදම් මූලාශකරණය

(වැඩසටහනේ ව්‍යාපෘති අනුව)

**වියදම ශීර්ෂ අංකය: 254** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| අදාලවන නීතිය | විෂය | ප්‍රභවය | පුනරාවර්ථන | | | | එකතුව | | වියදමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යාපෘති 01 | | ව්‍යාපෘති 02 | | | | |
| | | | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | |
| | | | 1 | 2 | 3 | 4 | 5 | 6 | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| විසර්ජන පනත | 11 | දේශීය අරමුදල් | | | | | | | |
| | | පුනරාවර්ථන | 154,650,000.00 | 153,402,151 | 633,999,466 | 632,067,743 | 788,649,466 | 785,469,894 | 99.6 |
| | 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 13 | විදේශීයආධාර - ප්‍රදාන | | | | | | | |
| | 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| | 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | | |
| විශේෂ නිතී | 21 | දේශීයඅරමුදල් | | | | | | | |
| | | **එකතුව (පුනරාවර්ථන)** | **154,650,000.00** | **153,402,151** | **633,999,466** | **632,067,743** | **788,649,466** | **785,469,894** | 99.6 |
| | | (අදාල නොවන වචන කපා හරින්න) | | | | | | | |

ඩී.ජී.එස්.ඒ - 5 (i)

# වියදම් මූල්‍යකරණය

(වැඩසටහනේ ව්‍යාපෘති අනුව)

**වියදම ශීර්ෂ අංකය: 254** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| අදාලවන නීතිය | විෂය | ප්‍රභවය | මූලධන | | | | එකතුව | | වියදමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යාපෘති 01 | | ව්‍යාපෘති 02 | | | | |
| | | | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | |
| | | | 1 | 2 | 3 | 4 | 5 | 6 | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| **විසර්ජන පනත** | 11 | දේශීය අරමුදල් | | | | | | | |
| | | මූලධන | 16,850,000 | 13,031,534 | 48,000,000 | 36,632,310 | 64,850,000 | 49,663,844 | 76.60 |
| | 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| | 17 | විදේශාධාර සම්බන්ධ දේශීයඅරමුදල් | | | | | | | |
| **විශේෂ නීතී** | 21 | දේශීය අරමුදල් | | | | | | | |
| | | **එකතුව (මූලධන)** | **16,850,000** | **13,031,534** | **48,000,000** | **36,632,310** | **64,850,000** | **49,663,844** | 76.60 |
| | | (අදාල නොවන වචන කපා හරින්න) | | | | | | | |

ඩී.ජී.එස්.ඒ- 5

# වියදම් මූලාකරණ සාරාංශය

(පුනරාවර්තන වියදම් වල ඓක්‍යය)

**වියදම ශීර්ෂ අංකය: 254** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| අදාලවන නීතිය | විෂය | ප්‍රභවය | පුනරාවර්තන - ව්‍යාපෘති 01 - ශුද්ධ ප්‍රතිපාදන | පුනරාවර්තන - ව්‍යාපෘති 01 - සත්‍ය වියදම | පුනරාවර්තන - ව්‍යාපෘති 02 - ශුද්ධ ප්‍රතිපාදන | පුනරාවර්තන - ව්‍යාපෘති 02 - සත්‍ය වියදම | එකතුව - ශුද්ධ ප්‍රතිපාදන | එකතුව - සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| **විසර්ජන පනත** | 11 | දේශීය අරමුදල් | | | | | | | |
| | | පුනරාවර්තන | 788,841,000 | 785,469,894 | | | 788,841,000 | 785,469,894 | 99.6 |
| | 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| | 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | | |
| **විශේෂ නිති** | 21 | දේශීයඅරමුදල් | | | | | | | |
| | | **එකතුව (පුනරාවර්තන)** | **788,841,000** | **785,469,894** | **-** | **-** | **788,841,000** | **785,469,894** | 99.6 |
| | | (අදාල නොවන වචන කපා හරින්න) | | | | | | | |

ඩී.ජී.එස්.ඒ- 5

# වියදම් මූල්‍යකරණ සාරාංශය

(මූලධන වියදම් වල ඓක්‍යය)

**වියදම ශීර්ෂ අංකය: 254** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| අදාලවන නීතිය | විෂය | ප්‍රභවය | මූලධන | | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වැඩසටහන 01 | | වැඩසටහන 02 | | | | |
| | | | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය % |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| **විසර්ජන පනත** | 11 | දේශීය අරමුදල් | | | | | | | |
| | | පුනරාවර්ථන | 64,850,000 | 49,663,844 | - | - | 64,850,000 | 49,663,844 | 76.6 |
| | 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | |
| | 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| | 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| | 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | | |
| **විශේෂ නීති** | 21 | දේශීයඅරමුදල් | | | | | | | |
| | | **එකතුව (පුනරාවර්ථන)** | **64,850,000** | **49,663,844** | **-** | **-** | **64,850,000** | **49,663,844** | 76.6 |
| | | (අදාල නොවන වචන කපා හරින්න) | | | | | | | |

## 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## පොදු තැන්පත් ගිණුම - 6000/0/0/15/134

| 2013.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ බැර කිරීම් | වර්ෂය තුළ හර කිරීම් | 2013.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| රු. | රු. | රු. | රු. |
| 183,742.40 | 14,854,161.15 | 14,926,137.52 | 111,766.03 |

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් " බී " ගිණුම
## 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය
## විෂයය අංකය : 25401

| | වියදමේ උපරිම සීමාව (රුපියල්) | ලැබීම්වල අවම සීමාව (රුපියල්) | හර ශේෂ උපරිම සීමාව (රුපියල්) |
|---|---|---|---|
| **01.විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන්** | 64,000,000.00 | 35,000,000.00 | 22,000,000.00 |
| වර්ෂය තුළ ප්‍රතිශෝධන සීමාව | | | |
| (i) නියෝග අංකය DB/PE2/81601/03/2013 | | | 200,000,000.00 |
| (ii) නියෝග අංකය | | | |
| | **64,000,000.00** | **35,000,000.00** | **200,000,000.00** |
| වර්ෂය අවසානයේ තත්‍ය අගයන් | 68,437,855.01 | 52,933,744.63 | 157,867,114.26 |
| මු.රෙ.503 (1) ප්‍රකාර ගැලපුම් | | | |
| (රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 401 ප්‍රකාර අඩු කිරිම්) (ඇමුණුම් 01/ ඇමුණුම් 02) | (17,925,616.41) | (13,889,343.52) | (4,036,272.89) |
| | **50,512,238.60** | **39,044,401.11** | **153,830,841.37** |
| සීමා නියමයන් පිළි නොපැදිම | නැත | නැත | නැත |